**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ටීඑන්ඒ සහ "ස්වයං නිර්නයේ" ක්‍රියාමාර්ගය

## Sri Lanka: The TNA and the program of "self determination"

**විජේ ඩයස් විසිනි**

**2010 අප්‍රේල් 02**

දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ), පසුගිය මැයි මාසයේ දී ශ්‍රී ලංකා හමුදාව විසින් වසර 26ක සටනකින් අනතුරුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) පරාජය කරනු ලැබුවේ කෙසේද යන පැහැදිලි පැනයට පිලිතුරු දීම කෙසේ වෙතත් එම කරුන මතු කිරීමට පවා අපොහොසත් මැතිවරන ප්‍රකාශනයක් අප්‍රේල් 8 දාට නියමිත ශ්‍රී ලංකාවේ මහ මැතිවරනය වෙනුවෙන් ඉදිරිපත් කර තිබේ.

ධනේශ්වර පක්ෂ ගනනාවක එකමුතුවක් ලෙස 2001 වසරේ දී පිහිටුවූ ටීඑන්ඒය වසර 8ක් මුලුල්ලේ "දෙමල ජනතාවගේ එකම නියෝජිතයාය" යන එල්ටීටීඊයේ සාවද්‍ය කියාපෑම පිලි ගනිමින් එහි හොරනෑවක් ලෙස ක්‍රියාත්මක විය. එහෙත් ටීඑන්ඒයේ දීර්ඝ මැතිවරන ප්‍රකාශනය තුල 75,000 ක ජීවිත බිලිගත්තා වූ ද එමෙන් කීප ගුනයක් අනාථ භාවයේ හෙලුවා වූ ද උතුරේ සහ නැගෙනහිරේ අතිවිශාල ප්‍රදේශයක් විනාශමුඛයේ දැමුනා වූ ද යුද්ධය පිලිබඳව සඳහන් වන්නේ උඩින් පල්ලෙනි. හුමුදාවේ අවසාන මෘග ප්‍රහාරය පිලිබඳව වන කෙටි සඳහන තුල එල්ටීටීඊය ලංකාව තුල තව දුරටත් සංවිධානාත්මක දේශපාලන හෝ මිලිටරි බලයක් ලෙස නොපවතින්නේය යන කරුන සටහන් නොකරයි.

පසුගිය මැයි මාසයේ තත්වය කෙසේ වී ද? ජනවාරියේ දී සිය පාලන කේන්ද්‍රය වූ කිලිනොච්චියෙන් පලවා හරිනු ලැබූ එල්ටීටීඊය ගුවනින් හා කාලතුවක්කුවලින් නොකඩවා ප්‍රහාර එල්ල වන දිවයිනේ ඊසාන දිග ප්‍රදේශයේ කුඩා බිම්කඩක හිර වී සිටියේ ය. සිවිල් වැසියන් දහස් ගනනක් මරා දැමෙද්දී එල්ටීටීඊ ප්‍රතිරෝධය කැබලි වී ගිය අතර එල්ටීටීඊ ඉහල නායකත්වය ඝාතනය කලේ ය. හමුදාව 250,000ක පමන සිවිල් වැසියන් රැඳවුම් කඳවුරුවලට ගාල් කල අතර 100,000 ක් පමන තවමත් ඒවායේ සිටිති. දහස් ගනනක් දෙමල තරුනයෝ "ත්‍රස්ත සැකකරුවන්" ලෙස හෙලි නොකල සිර ගෙවල රඳවා ගෙන සිටිති.

එල්ටීටීඊයේ නින්දා සහගත ඇද වැටීම මූලිකවම මිලිටරි පරාජයක් නොව එහි දේශපාලන බංකොලොත්කමේ ප්‍රතිපලයකි. පටු වෙරල තීරුවක හිරවූ එල්ටීටීඊයට දිවයිනේ දෙමල සුලුතරයේ ක්‍රියාකාරී සහයෝගය අහිමි වී ගියේ ය. ජාත්‍යන්තර කම්කරු පන්තිය කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ හෝ අසල්වැසි ඉන්දියාවේ කම්කරු පන්තිය වෙත ආයාචනා කිරීමට එහි නායකයෝ ඓන්ද්‍රියව ම අපොහොසත් වූහ. ඒ වෙනුවට එල්ටීටීඊය "ජාත්‍යන්තර ප්‍රජාව", එනම් ජනාධිපති රාජපක්ෂ අලුතින් ආරම්භ කල යුද්ධයට දේශපාලනිකව හා මිලිටරිමය ලෙස බැකිම සැපයූ ඉන්දීය, යුරෝපීය සහ ඇමරිකානු ආන්ඩු වෙත සටන නවතන ලෙස කන්නලව් කරන තත්වයකට ලඝු වී ගියේ ය.

මෙම විනාශය ගලා ආවේ "ස්වයං නීර්නය" පිලිබඳව එල්ටීටීඊ ක්‍රියාමාර්ගයේ තර්කය තුලින් ය. ඊලම් දෙමල ධනපති රාජ්‍යයක හෝ ධනපති ශ්‍රී ලංකාව තුල උතුරේ හා නැගෙනහිර ස්වයං පාලනයක් ලෙස හෝ වේවා එල්ටීටීඊයේ මූලික ඉල්ලීම සෑම කල්හිම දෙමල ධනේශ්වරයේ උවමනාව නියෝජනය කලා මිස දෙමල ජනයා නියෝජනය නොකලේ ය. ටීඑන්ඒය මෙම ගැටලු සාකච්ඡා කිරීමට පවා අපොහොසත් වන්නේ ඔවුන් වැඩ කරන ජනතාවට විනාශය කැඳවූ ඉදිරිදර්ශනයම අඛන්ඩව ඉදිරියට ගෙන යන බැවින් ය.

1976 දී දෙමල එක්සත් විමුක්ති පෙරමුන (ටියූඑල්එෆ්) පලමු වරට වෙනම ඊලමක් පිලිබඳව කරුන ඉදිරිපත් කිරීමේ දී පිලිබිඹු වූයේ දෙමල ජනයාට විරුද්ධව දශක ගනනාවක් තිස්සේ සිදු කැරුන නිල වෙනස්කම් කිරීම් වලින් දෙමල ප්‍රභූවේ ඇතිවූ ඉච්චා භංගත්වයයි. පාර්ලිමේන්තු උපාමාරු වලින් සිය ඉලක්කයන් ලඟා කර ගැනීමට ටියූඑල්එෆ් මුලුමනින්ම අසමත් වීමට ප්‍රතිචාර ලෙස එල්ටීටීඊය සහ අනෙකුත් කන්ඩායම් මතු වී ආවේ ය.

ටීඑන්ඒ ප්‍රකාශනය සුමට ලෙස මෙසේ පවසයි: "මුලදී සන්නද්ධ කන්ඩායම් කිහිපයක් සිටිය ද 1987 සිට එල්ටීටීඊය දෙමල ජනයාට වෙනම නිජ බිමක් සඳහා සටන් කරන එකම මිලිටරි කන්ඩායම ලෙස මතු වී ආවේ ය." ටීඑන්ඒය පැහැදිලි කිරීමෙන් මගහැර සිටින්නේ එල්ටීටීඊය මතු වී ආවේ සිය විරුද්ධවාදීන් කුරිරු ලෙස මර්දනය කිරීමෙන් ය යන කාරනාව ය.

එහි ඉතිහාසය පුරා ම එල්ටීටීඊය සිය විරුද්ධවාදීන් මැඩීම හා ඝාතනය කිරීම ඔස්සේ "දෙමල ජනයාගේ එකම නියෝජනය" යන කියා පෑම බලයෙන් පැටවීය. බදු ඉහල දැමීම, බලහත්කාරයෙන් බඳවා ගැනීම සහ මර්දනකාරී විධිවිධාන ඔවුන්ගේ පාලනයට නතු වූ ප්‍රදේශ වල දෙමල ජනයාගෙන් විශාල කොටසක් සතුරු කර ගත්තේ ය.

ටීඑන්ඒය මෙන්ම එල්ටීටීඊය ද උතුර සහ නැගෙනහිර ඓතිහාසික නිජබිමක් බව තරයේ කියා සිටියේ ය. ඔවුහු යුද්ධය වර්ගවාදී පදනමකින් සලකා එය දෙමල හා සිංහල ජනයා අතර අරගලයක් ලෙස දුටු අතර පාලන බලය දැරූ කොලඹ ආන්ඩුවල අපරාධයන් සාමාන්‍ය සිංහල ජනයා වෙත දෝෂාරෝපනය කලහ. 1990 දී එල්ටීටීඊය යාපන අර්ධද්වීපයේ සමස්ත මුස්ලිම් ජනතාව ම - ඉන් බහුතරය දෙමල බස වහරන්නන් ය - ඔවුන් ශ්‍රී ලංකා මිලිටරියේ ඔත්තුකරුවන් බව පවසමින් පලවා හැරියේ ය. මහ බැංකුව, දුම්රිය හා බස්රිය බෝම්බ පිපිරවීම ඇතුලු සිංහල ජනයාට එල්ල කල වග විභාගයක් නැති ප්‍රහාරයන්ගේ එකම ප්‍රතිඵලය වූයේ සිංහල අන්තවාදීන්ගේ අරමුන තහවුරු වීම හා දිවයිනේ වාර්ගික බෙදීම් තවත් මුල් ඇල්ලීම ය.

2009 මැයි වලදී එල්ටීටීඊය "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචනය කිරීම මගින් ඔවුන්ගේ වෙනම ඊලමක ව්‍යාපෘතිය සෑම විටම පදනම් වූයේ ඒ හෝ මේ ප්‍රදේශීය ප්‍රධාන බලවතෙකුගේ සහයෝගය අපේක්ෂාවෙන් බව සනිටුහන් කැරින. ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් තැබුවා වූ ද දිවයිනේ ඊනියා සාම සාධක හමුදාව එව්වා වූ ද 1987 වසර පිලිබඳව ටීඑන්ඒය උඩින්මත්තෙන් සඳහන් කරයි.

ඉන්දියාවේ අරමුන වූයේ දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් රැක දීම නොව උප මහාද්වීපයම අස්ථාවර කිරීමේ තර්ජනයක් වූ ගැටුම අවසන් කර දැමීම ය. කෙසේ වෙතත්, එල්ටීටීඊය ඉන්දු ලංකා ගිවිසුම විශ්වාස කරන ලෙස දෙමල ජනයාට කියා සිටි අතර "සාම සාධක හමුදා" සාදරයෙන් පිලිගත් නමුත් ඔවුන් දෙමල සටන් කරුවන් ව බලහත්කාරයෙන් නිරායුධ කිරීමට තැත් කල විට යලි හැරී ඉන්දියානු හමුදා සමග සටන් වැදුනේ ය.

ඉන්දීය හමුදා සමග සටන් කිරීම සඳහා එල්ටීටීඊය සිය පරම සතුරා වූ කොලඹ ආන්ඩුවේ ජනාධිපති ආර් ප්‍රේමදාස මත යැපුන අතර ඔහු ඔහුගේ ම වර්ගවාදී අරමුනු උදෙසා ඔවුන්ට මිලිටරි ආධාර සැපයීය.

මෙම සිද්ධියෙන් කිසිදු දේශපාලන නිගමනයක් උකහා නොගත් එල්ටීටීඊය 1991 දී ඉන්දීය අගමැති රජීව් ගාන්ධි ඝාතනය කරමින් ඉන්දීය ආන්ඩුවට ප්‍රතිප්‍රහාර එල්ල කලේ ය. පසු කලේක දී එල්ටීටීඊය සිය තකතිරු කමක් බව පිලිගත් මෙම ඝාතනය ජාත්‍යන්තර රඟමඬලේ ඔවුන්ගේ ස්ථාවරය දුර්වල කර දැමීය. එල්ටීටීඊය තහනම් කර දැමූ ඉන්දියාව දකුනු ප්‍රාන්ත තමිල් නාඩුවේ ඔවුගේ සහායකයන් මර්දනය කර දැමීය.

සීතල යුද්ධය අවසානයේ ජාත්‍යන්තර සබඳතාවන්ගේ වෙනස්වීම් හමුවේ එල්ටීටීඊය අන්දමන්ද විය. මැදපෙරදිග පලස්තීන විමුක්ති සංවිධානය, දකුනු අප්‍රිකාවේ අප්‍රිකානු ජාතික කොංග්‍රසය සේ ම එල්ටීටීඊය ද සමාජවාදී පූච්චානම් කානුවට විසිකර, නිදහස් වෙලඳම විවෘතව වැලඳගනිමින් සහ අධිරාජ්‍යවාදය සමග කූටාලිකමකට මාන බලමින් මීට ප්‍රතිචාර දැක්වීය.

2001 සැප්තැම්බර් 11 පසු කාලයේදී එල්ටීටීඊය ප්‍රධාන අධිරාජ්‍යබලවතුන් විසින් අනුග්‍රහය දැක්වූ "සාම ක්‍රියාදාමය"ට සහභාගිවීමේ තදියම නිසා ස්වාධීන ඊලමක් සඳහා වූ සිය ඉල්ලීම අතහැර දමමින් ඇමරිකාවේ "ත්‍රස්තවිරෝධී යුද්ධයේ" ඉලක්කයන් වීමෙන් බේරීමේ යටිකූට්ටුකම්වල යෙදින. එලඹෙන ඕනෑම විසඳුමකදී එල්ටීටීඊයට ඉතා සුලු භූමිකාවක් සඳහා පමනක් ඉන්දියාව හා ඇමරිකාව ඉඩ සලසන බව පැහැදිලි වුන විට ටීඑන්ඒ පූර්න පිටුබලය ඇතිව පැවැත්වුන සාකච්ඡා බිඳ වැටින. උතුරට එරෙහිව නැගෙනහිර "ස්වයංනිර්නය අයිතිය" පිලිබඳව ප්‍රකාශකරමින් 2004 දී එල්ටීටීඊයේ නැගෙනහිර මිලිටරි අංශය බිඳී වෙන් වීමෙන් එල්ටීටීඊය බෙලහීන විය.

2006 මැද භාගයේ දී ජනාධිපති රාජපක්ෂ යලිත්වරක් රට යුද්ධයට ඇද දැමූ විට ඔහු විසින් එලිපිට 2002 සටන් විරාමය උල්ලංඝනය කිරීම හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කිරීම පිලිබඳව සමස්ථ "ජාත්‍යන්තර ප්‍රජාව" ම ඇස ඇර නොබැලීය. ඇමරිකාව, චීනය, පකිස්ථානය, ඊස්රායලය හා ඉන්දියාව යන සියල්ල ශ්‍රී ලංකා මිලිටරියට ද්‍රව්‍යමය සහයෝගය සැපයීය. දෙමල ඩයස්පෝරාවෙන් සැපයුනු තීරනාත්මක මූල්‍ය හා දේශපාලන සහාය කපා හරිමින් එල්ටීටීඊය "ත්‍රස්ත සංවිධානයක්" ලෙස නම් කිරීමට ඇමරිකාව කැනඩාවේ සහ යුරෝපා සංගමයේ අත් ඇඹරීය. සහයෝගය බිඳ වැටෙද්දී එල්ටීටීඊය සිය පාලනයට නතු ප්‍රදේශ වල ජනයා තව දුරටත් විරසක කර ගනිමින් බලහත්කාරය යෙදවීම උත්සන්න කලේ ය. 2009 ඔවුන්ගේ මිලිටරි පරාජය දේශපාලන හුදකලාවේ අවසන් ප්‍රතිඵලය විය.

එල්ටීටීඊයේ පරාජය හමුවේ ටීඑන්ඒය කොලඹ දේශපාලන සංස්ථාපිතය හා යලි එක් වීමට තැත් කරමින් සිටී. මන්ත්‍රීවරු ගනනාවක් ම රාජපක්ෂ ආන්ඩුව හා එක් වීමට කඩාගෙන ගියහ. 2006 සිට 2009 දක්වා එල්ටීටීඊයට එරෙහිව තිරිසන් යුද්ධය ගෙනයාමට වගකිව යුතු විරුද්ධ පක්ෂ අපේක්ෂක විශ්‍රාමික ජෙනරාල් සරත් ෆොන්සේකාට ටීඑන්ඒය සහයෝගය

දැක්වීය. ටීඑන්ඒ ප්‍රකාශයේ මෙම කාරනාව සඳහන් නොවීම පුදුමයක් නොවේ. කන්ඩායම් දෙකක් ටීඑන්ඒය විවේචනය කරමින් ඉන් ඉවත්ව ඇතත් මෙම විවිධාකාර වූ සියලු කන්ඩායම් "ස්වයං නිර්න" ක්‍රියාමාර්ගය මත පදනම් වී සිටිති.

ටීඑන්ඒය එල්ටීටීඊයේ සන්නද්ධ අරගලය සාමකාමී විරෝධතා සහ පාර්ලිමේන්තු වෙට්ටු දැමීම් ඉදිරියට දැමීමකින් විස්ථාපනය කර තිබේ: තම උත්සුකයන් වන දෙමල ජනයාට එරෙහි ජන ඝාතක ක්‍රියාමාර්ගය වටහා ගන්නා ලෙස ඉන්දියාව සහ ජාත්‍යන්තර ප්‍රජාව පොලඹවන බව එම මැතිවරන ප්‍රකාශනයේ සඳහන්ව තිබේ. ස්වයං පාලිත උතුර සහ නැගෙනහිර සමග බැඳුනු ඉදිරිදර්ශනය තුල ඍජු ආයෝජන තීන්දු ගැනීමේ බලතල සහ ආර්ථික වර්ධනයට උපකාරී වනු පිනිස දෙමල ව්‍යාපාරිකයන්ට යලි ශ්‍රී ලංකාවට පැමිනෙන ලෙස කරන ආයාචනා ඇතුලත් ය. වෙනත් වචනවලින් පැවසුවහොත් මෙම ලියවිල්ල සරලව සලකුනු කරන්නේ උපායාත්මක පියවර මාරුවක් හා 1970 ගනන්වල ටීයූඑල්එෆ් ක්‍රියාමාර්ගයට යලි හැරීමක් ය.

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය අති විශාල අන්තරායකට මුහුන දී සිටී. මැතිවරනය හමාර වූ වහාම ජනාධිපති රාජපක්ෂ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා සිටින සාගත විධිවිධාන ක්‍රියාවට දැමීම අරඹනු ඇති අතර එහි අර්ථය වනු ඇත්තේ ජීවන තත්වයන් ව්‍යසනකාරීව කප්පාදු කිරීමය. ඔහු එල්ටීටීඊය සමග යුද්ධය ගෙනයාමේදී යොදාගත් සියලු පොලිස්-රාජ්‍ය විධිවිධාන කම්කරු පන්තික විරුද්ධත්වය මැඩලීමට යොදා ගනු ඇත. කම්කරු පන්තියේ ඕනෑම ප්‍රතිප්‍රහාරයක් සඳහා වන පූර්ව කොන්දේසිය වනුයේ එය එක්සත් විය යුතු බවය. එනම්, කම්කරු පන්තිය තමන්ව බෙදා දැමීමට හා දුර්වල කිරීමට පමනක් ම හේතුවන සියලු ආකාරයේ ජාතිකවාදයන් හා වර්ගවාදයන් ප්‍රතික්ෂේප කල යුතුය.

දෙමල කම්කරුවන්ට සහ තරුනයන්ට මෙහි අර්ථය වනුයේ ධනේශ්වර දෙමල ස්වයං නිර්න ක්‍රියාමාර්ගය තීරනාත්මකව ප්‍රතික්ෂේප කිරීම ය. නිදහසින් දශක හයකට පසුවත් ශ්‍රී ලංකාවේ ධනේශ්වරය තමන් අති මූලික ප්‍රජාතන්ත්‍රීය කර්තව්‍යයන් ඉෂ්ට කිරීමට අසමත් බව සමස්තයක් ලෙස ඔප්පු කර ඇති අතර එහි පාලනය වර්ගවාදය හා ප්‍රචන්ඩත්වය හරහා පවත්වාගෙන ගොස් තිබේ. ප්‍රජාතන්ත්‍ර අයිතීන් සඳහා වන අරගලය සියලු කම්කරු ජනයා මුහුන දෙන පන්ති ගැටලුවක් වන අතර එය දිනා ගත හැක්කේ ලාභ පද්ධතිය අහෝසි කරන ඒකාබද්ධ සටනක් ලෙස පමනි. එම ඉදිරිදර්ශනයේ හා දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වන පලල් ඉදිරිදර්ශනයෙන් මග පෙන්වනු ලබන සහ එහි කොටසක් ලෙස ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් පිහිටීමට සටන් කරන එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය පමනි.

© www.wsws.org